කාත්තන්කුඩි නගර සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 06 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 19 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කාත්තන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහය ප්‍රකාශන ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංශ 2 අනුව නිසිපරිදි පිළියෙල කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්
--------------------

මිය ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවියයුතු තිබූ රු. 42,037 ක හිඟ ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර 2010 වර්ෂයේ සිට දිගටම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගතකර තිබුණි.

1.3.3 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම
------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණවූ නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| නගර සභා ආඥා පනත (අධිකාරය 255) | |
| I වගන්තිය 177(2) | 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය මහජනයාගේ දැන ගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට සභාව විසින් 2014 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 12,602,309 ක් වූ අතර, එය සැසඳීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 4,354,466 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,247,843 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

-------------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | අයකළ | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | % |
| වරිපනම් හා බදු | 8,900 | 8,730 | 170 | 01 |
| බදු | 5,100 | 4,445 | 655 | 12 |
| වෙනත් ආදායම් | 21,145 | 14,674 | 6,470 | 30 |

2.2.2 වරිපනම් සහ බදු

------------------

නගර සභා ආඥාපනතේ(අධිකාරය 255) 160 වගන්තිය අනුව නගර සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි 2014 වර්ෂය අවසානය දක්වා අයවියයුතු මුළු එකතුව රු. 4,965,387 ක වරිපනම්බදු අයකරගෙන නොතිබුණි.

2.2.3 උසාවි දඩ මුදල්

------------------

විවිධ ආඥාපනත් යටතේ මහේස්ත්‍රාත් උසාවියෙන් 2014 දෙසැම්බර් 31දිනට ලැබියයුතු රු. 381,572 ක උසාවි දඩ මුදල් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතුකර නොතිබුණි.

2.2.4 සභාවේ ඉඩම් බදුදීම

-----------------------

සභාව සතු පර්චස් 15 ප්‍රමාණයේ ඉඩම එක් පුද්ගලයෙකුට සමාලෝචිත වර්ෂයේදී වර්ෂ 02 ක් සඳහා සිමේන්ති කොන්ක්‍රීට් ගල් ( Paved Blocks ) නිෂ්පාදන කර්මාන්තයක් පවත්වා ගෙනයාම සඳහා බදු දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරික්ෂණය විය.

(අ) රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව මෙම ඉඩම් අදාල පුද්ගලයක්ට බදු දී තිබුණි.

(ආ) මෙම ඉඩමේ වර්තමානයේ පවතින මාසික කුලි වටිනාකම් රු. 20,000 වුවද රු. 7,500 මාසික බද්දකට බදු දී තිබීමෙන් රු. 150,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) පළාත් පාලන පළාත් සභා අමාත්‍යංශයේ පීඑස්/1/05/25 අංක දරණ 2009 දෙසැම්බර් 14 දින ලිපිය අනුව පළාත් පාලන ආයතනය සතු ඉඩම් බදු දීමේ අවස්ථාවලදී වර්තමාන වටිනාකම තක්සේරුකර එම වටිනාකමින් 25% ක් පළමු ගෙවීම් වශයෙන් ගෙවිය යුතු වුවද මාස 3 ක බදු මුදල වන රු. 22,500 ක් පමණක් මූලික ගෙවීම් වශයෙන් ගෙවා තිබුණි.

2.2.5 ව්‍යාපාර බලපත්‍ර ගාස්තු

------------------------

සමාලෝචි වර්ෂයේදී අයවියයුතු රු. 129,975 ක ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.6 වෙනත් ආදායම්

-----------------

සභාවේ ඝාතනාගාරයේ ඝාතනය කරනු ලබන ගවයන්ගේ හම් 2012 ඔක්තෝබර් 10 වන දින සිට වර්ෂ 10 කට විකිණීම සඳහා එක් පුද්ගලයෙකු සමඟ ගිවිසුමක් අත්සත්කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දින දක්වා රු. 514,000 ක ආදායමක් ලබාගෙන තිබුණි. කෙසේවුවද, ගවහම් විකිණීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශනයේ වගන්ති 2.14.1 අනුව මිලගණන් කැඳවා නොතිබුණි.

තවද, නගර සභා ආඥාපනතේ (අධිකාරය 255) වගන්ති 39 අනුව වසර පහකට වඩා වැඩි කාලයක් සඳහාවූ ගිවිසුම් කිසිවක් සභා සම්මතයකින් තොරව සභාපති විසින් ගිවිසුම්ගත විය නොහැකිය. කෙසේවුවද, ඉහත නීති විධිවිධාන වලට පටහැනිව සභාවේ සභාපති විසින් ඉහත කරුණු වෙනුවෙන් ගිවිසුම් ගතවී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කළමණාකරණ දුර්වලතා

----------------------------

(අ) ත්‍රිකුණාමලය හා කින්නියාව අතර මගී ප්‍රවාහන සේවයක් ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගෙන තිබූ කාත්තන්කුඩි සහ පඩුවන්කරෙයි අතර මගී ප්‍රවාහන බෝට්ටු සේවයක් ආරම්භ කිරීම සඳහා 2013 වර්ෂයේදී නගර අතර පාලම් ඉදිකිරීමෙන් පසු අතහැර දමන ලද මගී ප්‍රවාහන බෝට්ටුව (Passenger Ferry) රු. 323,550 ක් වැයකර කාත්තන්කුඩියට ගෙන එනලද වුවද අද දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් 1995 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල වන රු. 2,375,058 මුදලක් ගෙවිය යුතුව තිබුණද එය ගෙවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) 1987 වර්ෂයේදී ප්‍රාදේශීය සභා ආරම්භ කිරීමට ප්‍රථම නගර සභා වශයෙන් ක්‍රියාත්මක වූ කාලයේ ලංකා විදුලි බල මණ්ඩලය වෙනුවෙන් මහජනයා වෙත විදුලිය සපයා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විදුලිබල මණ්ඩලයට ලබාදී තිබූ රු.2,399,352 ක අත්තිකාරම් මුදල අයකර ගැනීම සඳහා සභාව විසින් 1991 වර්ෂයේ සිට ඵලදායි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ii) විදුලිය සැපයීම වෙනුවෙන් මහජනතාවගෙන් විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතුව තිබූ රු.6,642,880 ක හිඟ විදුලි ගාස්තු අයකර ගැනීම සඳහා පසුගිය අවුරුදු 21 කට වඩා වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි.

(ඈ) නගර සභා ආඥා පනතේ (අධිකාරය 255) වගන්ති 227(එ) අනුව සභාව සමඟ එළඹු ගිවිසුම් හෝ ඒ වෙනුවෙන් කරනු ලද කටයුතුවල හෝ ඍජුව හෝ වක්‍රව වශයෙන් කිසියම් නගර සභාවක මන්ත්‍රවරයෙකු, නිලධාරියකු, සේවයකයකු උනන්දුවක් දක්වන්නෙකු හෝ මුදල්මය වාසියක් බලා පොරුත්තුවෙන්නෙකු විය යුතු නොවේ. කෙසේවුවද, සභාවේ සභාපතිගේ සහෝදරයකුට අයත් වෑන් රථය කුලියට ලබා ගෙන රු. 1,172,095 ක මුදලක් වාහන කුලිය වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඉ) PVC පයිප්ප පනහක්, ගල් කඩන යන්ත්‍ර දෙකක්, FOTON වර්ගයේ වාහන දෙකක්, කොම්පෙට්ටර් වර්ගයේ වාහනයක් සහ ජල ඉසින මෝටරයක් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් සභාවේ තිබුණද ඒවා 2014 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාව (Board of Survey), ස්ථාවර වත්කම් ලේඛනය, අපහරන ලේඛනය යනාදී ලේඛනවලට ඇතුලත් කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සභාව සතු NIZAN වර්ගයේ වාහනය ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර සමාලෝචිත වර්ෂයේදී රු. 1,190,000 ක් වැයකර පුද්ගලික ගරාජයක සමාලෝචිත වර්ෂයේදී අළුත්වැඩියා කර තිබුණි. කෙසේවුවද, ඉහත වාහනය නැවතත් ක්‍රියාවිරහිත වීම නිසා ප්‍රයෝජනයට නොගෙන වාහන අංගනයේ තවතා තබා තිබුණි.

3.3 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා යොදා ගනු ලබන ටෙයිලර් විසිතුනක් ට්‍රැක්ටර් රථ, නොමැතිවීම නිසා වර්ෂ 5 පමණ කාලයට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට නොගෙන සභා වැඩපලේ තිබුණි.

(ආ) ආපදා අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා USAID ආයතනයෙන් සභාවට ලබාදුන් බෝට්ටුව සහ එන්ජිම (outboard engine) එක් පුද්කලයකුට ගිවිසුමකින් තොරව වර්ෂ දෙකට පෙර ලබා දී තිබුණි. කෙසේවුවද, යන්ත්‍රයේ බදු කුලී අයකිරීමට හෝ යන්ත්‍රය ආපසු ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය

----------------------------------

‘ පිළිසරු ’ වැඩ සටහන් යටතේ කොම්පොස්ට් පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයක් 2013 වර්ෂයේදී රු. 1,669,227 ක් පිරිවැයෙන් ආරම්භකර තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) ඝණ අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවා තිබුණද, ඝණ අපද්‍රව්‍ය සභා බල ප්‍රදේශයේ පිහිටි ගඟ ඉවුරට බැහැරකර තිබුණි.

(ආ) සභා සතුව වාහන 20 ක් තිබුණද, ගඟ ඉව්රේ බැහැරකරන ඝණ අපද්‍රව්‍ය වැසීම සඳහා පස් ප්‍රවාහනය කිරීමට ලොරි කුලිය වශයෙන් රු. 90,000 ක් එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2014 ජුනි 02 දින ගෙවා තිබුණි.

(ඇ) සභාව සතුව රු. 11,900,000 ක් වටිනා "බැකෝ" ලෝඩර් යන්ත්‍රයක් තිබුණද, ගඟ ඉවුරේ බැහැරකරන ඝණ අපද්‍රව්‍ය සමතලා කිරීම සඳහා බැකෝ යන්ත්‍රයක් කුලියට ලබාගෙන ඒ සඳහා එක් පුද්ගලයකුට රු. 40,000 ක් 2014 ජූලි 11 වන දින ගෙවා තිබුණි.

(ඈ) සභාව සතුව ට්‍රැක්ටර් යන්ත්‍ර 15 ක් තිබුණද, ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ට්‍රැක්ටර් යන්ත්‍ර කුලියට ලබාගෙන එක් පුද්ගලයකුට රු. 1,500 ක් බැගින් මුළු මදල රු. 156,000 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඉ) ඝණ අපද්‍රව්‍ය ගඟ ඉව්රේ බැහැර කිරීමේ හේතුවෙන් පරිසරය දූෂණය වන බවට මහජනයා විසින් සභාවට එරෙහිව උසාවියේ නඩු කීහිපයක් පවරා තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

අයවැයගත වියදම් සහ තත්‍ය ආදායම් අතර 57% සිට 95% දක්වා විචලනයක් නිරීක්ණය වූහෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම් කරණය
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ඇයවැය පාලනය